

# කරළියට බැඳී පෙම

ජයලත් මනෝරත්න

අප ශ්‍රී ලාංකිකයන් වෙමු. අප අතරින් බොහෝ දෙන රටින් පිටව යති. ඇතැමුන් වහා ආපසු එති. තවත් අය ටික කලක් හිඳ ආපසු පැමිණෙති. තවත් අය ඉඳහිට මෙහි එති. පිරිසක් සදහටම එහි වෙසෙති. මේ අවසන් කාණ්ඩය අතරින් සමහරු සිතින් ද ගතින් ද විදේශයේම වෙසෙති. ඔවුන් සංස්කෘතිය සහ භාෂාව විසින් ද එකී දෙවැනි රටෙහි වැසින් ලෙසට අනුවර්තනය වෙති සමහරු ගතින් එහි විසුවද, සිතින් මව්රට මතකයේ වෙසෙති. දෙවැනි රටෙහි ජීවත් වීමේ අවශ්‍යතාව මත - එය රැකියාව හෝ අධ්‍යාපනය හෝ සෞඛ්‍ය හේතූන් විය හැක. භාෂාව සහ ජීවත්වීමේ ශෛලිය තාවකාලිකව වෙනස් කරගත්තද මව්බිමෙහි තමනට හිමි උරුමය කිසිලෙසකින් හෝ අතහැර නොදමති.

2002 වසරේ ජනවාරියේ දී ශ්‍රී ලංකාවෙන් බැහැරව නවසීලන්තයටත්, 2007 වසරේ ජනවාරියේ දී ඕස්ට්‍රේලියාවටත් පා තැබූ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ශ්‍රී ලාංකිකයන් වූ කුසුම්සිරි ලියනාරච්චි සහ යශෝදරා සරච්චන්ද්‍ර යුවළ, මා ඇතුලත් කරනුයේ ඉහත ඡේදයේ අවසන් කුලකයට ය. මා එසේ කරනු ලබන්නේ හිතුවක්කාරකමට හෝ යම් කාලසීමාවකදී ඔවුන් සමඟ වේදිකා නාට්‍යකරණයේ යෙදී සිටීම යන සාධක මත පිහිටා නොවේ. ගතවූ දශකය පුරාවට ඔවුන් දෙදෙනා සහ ඔවුන් දෙදෙනාගේ ක්‍රියාකාරකම් දෙස නිරීක්ෂණාත්මකව බලා සිටීමට හැකියාවක් ලද අයෙකු වීම මත පිහිටාය. විශේෂයෙන් නවසීලන්තයේ සහ ඕස්ට්‍රේලියාවේ සංචාරය කිරීමට කීප වතාවක් අප ලද අවස්ථාවන්ද පාදක කරගනිමිනි.

කෙසේ වෙතත් කුසුම් සහ යසා අපට මෑතකදී මුණ ගැසුනේ, මෙයට මාසයකට පමණ පෙර කොළඹ ලයනල් වෙන්ට් රඟහලේ දී කරලියට පැමිණි, ඔවුන් දෙදෙනා විසින් නිර්මාණය කරන්නට යෙදුනු, "දඟයා සහ පුංචි අංන්දරේ" නාටකද්වය රසවිඳීමට එහි ගිය අවස්ථාවේදීය. ජීවිතකාලය පුරාම නාටක නරඹමින් සිටින අපට, මෙදින අතිශය විශේෂ දිනයක් වූයේ, කාරණා කීපයක් නිසායැයි හැඟේ. කුසුම් සහ යසා විදෙස්ගත වූයේ අධ්‍යාපන කටයුතු වඩාත් ඉදිරියට සහ පරිපූර්ණ ලෙස කරගෙන යාමේ අභිලාෂයෙන් බව පැහැදිලිය. ඉන්පසු එම සුදුසුකම්වලට අනුගත වන වෘත්තීය පසුබිම සකසා ගැනීම උදෙසාය. මෙම කරුණු දෙක නිසියාකාරව සාක්ෂාත් කරගැනීමට නම්, ස්වකීය පුද්ගලික ජීවිතයම ඒ සඳහා කැපකළ යුතු බව, විදේශයන්හි වෙසෙන ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුගේ අත්දැකීමයි. තමාට පෙර අධ්‍යාපනය ප්‍රමුඛය. තමාට පෙර වෘත්තිය ප්‍රමුඛය. සැමටම එසේ නම් කුසුම්ට සහ යසාට ද එම කැපකිරීමේ අවශ්‍යතාව එලෙසෙම විය යුතුය. එසේද වුවත්, මෙම විශේෂිත දිනයේදී සවස හයයි තිහේ තුන්වෙනි සීනුවේ සිට නාට්‍යද්වයේ නළුනිලි ආචාරය තෙක් ගත වූ දෙහෝරාව අයව විශ්මිත කරනු ලැබූයේ, මව්බිමෙන් බැහැරව, පෙර කී වගකීමකින් යුක්තව අධ්‍යාපනය වෘත්තීය කටයුතුවල නියැලෙමින් වුවද, කටපුරා ශ්‍රී ලාංකික යැයි කිව හැකි නිර්මාණයක් අපට පුදකිරීමට ඔවුන් දෙපල ගෙන තිබූ අතිශය ආයාසකර සහ අතිශය සාර්ථක නිර්මාණදායකත්ත්වය මෙනෙහි කරලීමේදීය.

දීර්ඝ කාලයක් විදේශයන්හි ගත කරමින් හිඳ ඉතා සුළු කලකට මව්රටට පැමිණ මේ සා අසිරියක් මවාපෑම - විශේෂයෙන් ළමා සහ යොවුන් සහභාගී කරගෙන නිමවාලීම - අයව ප්‍රහර්ෂයට පත් කළ අනෙක් කරුණයි. නාට්‍ය කිරීම දුෂ්කර කරුණකි." දඟයා" නාට්‍යයට නළු නිලියන් විසිපස් දෙනෙකු සහභාගි වි සිටියහ. "පුංචි අන්දරේ" නාට්‍යයට ද විසිපස්දෙනෙකි. මේ හැරුණුකොට වාද්‍යවෘන්දය, රංගභූමි පරිපාලනය, අංගරචනය, රංගාලෝකය ආදී අනුශාංගික කටයුතු සඳහා තවත් පිරිසකි.

මේ සා විශාල සංඛ්‍යාවක් තෝරාගනිමින්, පුහුණු කරමින්, පාලනය කරමින් කුසුම් සහ යසා ලංකාවේ ගතකළ ඉතා සුළුකාලය අතුලත දී මෙබඳු වු රංග ආශ්චර්යයක් රසිකයනට තිළින කිරීමද විශ්මයක්මය.

"පුංචි අන්දරේ" නාට්‍යයට තේමාවන්නේ, අතීත ලක්දිව ජනශ්‍රුතියේ අතිශය ජනප්‍රිය චරිතයක් වන අන්දරේ නම් වූ රජවාසල කවටයාගේ ළමාකාලය ආශ්‍රිත රසබර කතා කීපයකි. අන්දරේ පිළිබඳව හෝ අන්දරේගේ ජීවිතයේ විවිධ අවස්ථා ගැන හෝ අන්රේට සිදු වූ නොයෙකුත් අකරතැබ්බයන් ගැන හෝ අසා නැති වැඩිහිටියෙකු නැති තරම්ය. මාතර හෝ නුවර යුගයේ විසීයැයි අනුමාන කෙරෙන අන්දරේ, ලොව බොහෝ රටවල විසූ රජවාසල කවටයන් මෙන්ම අතිශය ජනප්‍රිය චරිතයකි. ඉන්දියාවේ බීර්බල්, චීනයේ අමාන්ති, ඉතියෝපියාවේ අබුනබස්, පෝලන්තයේ අන්දරිකො, ඉන්දුනීසියාවේ සිකබායන්, අරාබියේ නස්රුදීන් ආදීන් ද රජවාසල කවටයන් පිරිසට වැටෙයි. එසේ ද වුවත් වත්මනෙහි අප දරුවනට මෙබඳු ජනකතා, ජනගීත, ජනකවි, ජනනාට්‍ය ආදිය රසවිඳීමට ඇති අවස්ථා ඉතා දුබල බැවින් අන්දරේ ගැන වුවද කයි කතන්දර ඇසීමේ අවසර අඩුය. එ නිසාම "පුංචි අන්දරේ" නාට්‍යයෙහි විනෝදාත්මක මෙන්ම අධ්‍යාපනික සහ සමාජයීය වැදගත්කමක්ද දෙගුණ තෙගුණ වෙයි.

විශේෂයෙන් මෙහි බස්වහර සහ රචනා විලාශය ගැන සඳහන් කළ යුතුමය. ළමා නාට්‍ය යනු ළමුන් උදෙසා ළමුන් විසින් හෝ ළමුන් උදෙසා වැඩිහිටියන් විසින් වශයෙන් දෙආකාර ගන්නා බව අප දනිමු. ළමා හා යොවුනන් විසින් "පුංචි අන්දරේ" රංගය පෝෂණය වුවත් එය ළමුණටම පමණක් නොව ඕනෑම වයස-"මට්ටමක නාට්‍ය රසිකයනට ගෝචර-වන්නක් බවට පත්වෙයි. සරළ බස්වහර සහ කවි රචනා, ප්‍රස්තුතයට ඉමහත් ශ්‍රද්ධාතීත්ත්වයක් ළඟා කරදෙයි. කවිවලට යෙදූ තනු මිහිරිවූවා පමණක් නොව අතිශය රංගෝචිතද වීය.

"දෑතේ වළලු පළඳා ලා
දෙපයේ ගිගිරා ලා
වරලස විහිදාලා ගෙනා
බැඳ නගෝ දියට බසිනා

පාට පාට ඇග රෙදි ඇඟ බව ලා
බාල ළමෝ ඔයට බසිනා
සීත වතුර රැලි රැලි නගිනා
බාල නගෝ දියෙහි කෙළිනා......"

ළමානාට්‍ය පිළිබඳ ශ්‍රී ලාංකීය සමාජයේ විශේෂඥවරියක වන සෝමලතා සුභසිංහ පැවසූ වදනක් මෙහිලා සිහිපත් කරගනු වටීයි..... ළමයින් සඳහා රඟදක්වනු ලබන නාට්‍ය පිටපත් රචකයින්, ළමා ප්‍රේක්ෂකයා පිළිබඳ හැකිතරම් දැනුම් සම්භාරයක් රැස්කරගැනීමට උත්සහ කළ යුතුය. එමෙන්ම ළමා ලෝකය (ළමයාගේ විශ්වාසයන්, හැඟීම්, සිතුම් පැතුම්) අත්දැකිය යුතුය.... දරුවන්ගේ මානසික, ශාරිරික, සමාජ අවබෝධය, රුචි අරුචිකම්, අවධානය රඳවාගත හැකි ආකාරයන් ආදිය පිළිබඳව මනා අධ්‍යයනයක් සිදු කළ යුතුය.... නාට්‍ය කතා වස්තුව සරල විය යුතුය. සංවාද කෙටි විය යුතුය. භාෂාව ළමයාට සමීප විය යුතුය...."

කුසුම් සහ යසා ඉහත අදහස් මනා ලෙස ගරුකොට ඇතිබවත්, එය ස්වකීය නිර්මාණයන් උදෙසා ගුරුකොට ඇති බවත් පැහැදිලිය.

"දඟයා" නාටකය වචනයේ අර්ථයෙන්ම ළමා සුන්දර වියේ හුරතල් දඟකාරකම් නාටකීය ප්‍රහර්ෂයකට ගොදුරුකරගැනීමට දැරූ වෑයමකි. එහි ලා කුසුම් පැවසූ වදන් මෙසේය. " මගේ පුතු වූ ඉඳු වූ කළ වයස අවුරුදු තුනක දඟයෙකි. දිනක් ඔහු කළ දඟකාර වැඩක් නිසා මට ඔහුට අවවාද කිරීමට සිදුවිණ. මගේ මුවින් පිටවූ වාග්ප්‍රහාරය අවසානයේ ඔහු මගෙන් මෙසේ ඇසීය...... ඇයි ඉතිං මම තාත්තා කියන දේවල් අහන්න ඕනෑ ? නාට්‍යය රචනය ඇරඹුනේ මෙම සිදුවිමෙන් පසුය.

මෙම නාට්‍ය දෙකම සංගීතයෙන්, ගායනයෙන් සහ නර්තනයෙන් ආඪ්‍ය වෙයි. එපමණක් නොව ඒ සියල්ල ශ්‍රී ලාංකේය ජන සංස්කෘතිය ද නියෝජනය කරයි. ජනගායනා රීතිය, ජනනැටුම් රීතිය මුල්තැන්හි ලා ප්‍රයුංජනය කළ ප්‍රාසාංගිකත්වය ළමුනට පමණක් නොව වැඩිහිටියනට ද සොඳුරු අත්දැකීමක්ම විය.

මෙය වඩාත් වැදගත් දිනයක් ලෙස ලිපියේ මුලින් සඳහන් වූයේ මේ දෙපළම විදේශයක වෙසෙමින්, ශ්‍රී ලාංකික රසිකයනට මෙම තිළිණය ලබාදිම යන කරුණස සැලකිල්ලට ගනිමිනි. මෙම හැඩරුවම තබාගෙන මෙම නාට්‍යද්වය මුලින් නිශ්පාදනය වූයේ ඕස්ට්‍රේලියාවේදීය. එක අතෙකින් අවිවේකය. අනෙක් අතින් එරට ජීවිතයට හැඩ ගැසී ඇති ළමුන්ගේ රංග ක්‍රියාකාරීත්වය මෙබඳු .දේශජ. ආරක ආකෘතියකට යොමුකරවා ගැනීමය. භාෂාව පරිහරණය, උච්චාරණ විධි, ජන නැටුම් හා ජනගායනා ස්වරූපයන්, භූමිකා රංගනයන් මේ ආදී වූ විවිධ අභියෝග ජයගැනීම එතරම් පහසු නොවෙයි. එසේද වුවත් ශ්‍රී ලාංකික ළමුන් සහ යොවුනන් යොදාගනිමින් අගනුවරදී නිමැවුණු මෙම නිශ්පාදනයට ඉතා සමීප වීමට එදා ඕස්ට්‍රේලියාවේදී ගොඩනැංවූ නිශ්පාදනය ද සමත්වීම මීට පෙර විදේශයකදී නොලැබුණු අත්දැකීමක් වූවාට සැක නැත. එනම් ළමා නාටකයක් මේ තරම් පළුල් අන්දමක නිශ්පාදනයක් ලෙස මීට ඉහතදී විදෙස් රටක නිර්මාණය වී යැයි තොරතුරක් අප නොදන්නා බැවිනි.

මෙම ඉතා කෙටි සටහන අවසන් කිරීමට පෙර කුසුම්සිරි විසින් මෙරට නාට්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට තිළිණ කළ පොත් පිංචක් ගැන වචනයක් පැවසීමට ද අත්‍යාවශ්‍ය බව හැඟෙයි. 'නාට්‍ය වැඩමුළුව' නම් වූ මෙම .ග්‍රන්ථය අධ්‍යක්ෂකට අත්වැලක් - රංගනයට ප්‍රායෝගික ප්‍රවිශ්ටයක් වශයෙන් විස්තර වෙයි.

දශක කීපයකට පසු ශ්‍රී ලංකාවේ වේදිකා නාටකය දැඩි ප්‍රබෝධයකට වත්මනෙහි පත්ව තිබෙයි. ත්‍රස්තවාදී උවදුරු නැතිවී යාම, ගමනාගමන පහසුකම් යථා ත්තවයට පත්වීම රූපවාහිනී නාටකයේ බිඳවැටීම, වේදිකා නාට්‍ය කෙරෙහි තරුණ ආකර්ශණය, නාට්‍ය හා රංග කලාව පාසැල් සහ විශ්ව විද්‍යාල විෂයයක් පරිද්දෙන් පවත්වාගෙන යාම, විවිධ වස්තුවිෂයය සහ ආකෘතීන් ප්‍රචලිතව ප්‍රයෝජනයට ගැනීම වැනි කරුණු එකී ප්‍රබෝධයෙහි පසුබිමෙහි වෙයි. අගනුවර මෙන්ම ප්‍රාදේශීය ගම් දනව්වල අද වේදිකා නාට්‍යයක් නොපැවැත්වෙන සති අන්තයක් නැති තරම්ය. කලාවට පිවිසෙන රසික සංඛ්‍යාව අතිශ්‍ය ඉහළය. නාට්‍ය ශිල්පීන්ගේ දින වෙනස්කරගැනීම පවා අද අර්බුදකාරී තත්වයක පවතී. ඉල්ලුම එතරම් ඉහළ බැවිනි.

මෙබඳු වකවානුවක මෙම මාධ්‍ය නිවැරදිව ග්‍රහණය කරගැනීමට නම් ආධුනිකයිනට පත පොත අත්‍යාවශ්‍යය. විශේෂිතව සිංහල භාෂාවෙන් ලියැවුණු පතපොතය. ඉදින් කුසුම්සිරිගේ මෙම පුස්ථකය ද එම අවශ්‍යතාවයට මහඟ පිටුබලයක් බව අපගේ දැනීමයි. නාට්‍යය යනු කුමක්ද, එහි ගුණාංග හා අවයව කවරේද, රංගභූමිය, අධ්‍යක්ෂ, චලනය, කටහඬ වැනි විෂයයන් යටතේ පෙළ ගැසුණු මෙය විශේෂයෙන්ම ඉතා ආරම්භයේ නාට්‍යකරණයේ යෙදෙන අංකුරයනට අනුප්‍රාභයක් සපයනු ඇත.

දුරු රටක වාසය කළද, ශ්‍රී ලාංකිකත්වය සහ එහි සොඳුරු සංස්කෘතිය ද කෙරෙහි නිබඳව සිත් යොමා තවදුරටත් අපගේම යැයි අනන්‍ය වූ නාට්‍ය කලාවක් කෙරෙහි පෙම් බඳිමින්, රට නොරට දූ දරුවන්ගේ සෞන්දර්යකාමී ගුණය වගා කරලීම අනේක වූ කැපකිරීමක් දරණ කුසුම්ටත් යසාටත් අපගේ ප්‍රණාමය !

